## සූත්‍ර ධර්ම ආශ්‍රයෙන් ගැටළු විසඳාගැනීම

## 'චතු පටිසම්භිදා ඤාණ ධර්ම'

## 12.05. 2018 - ශ්‍රී ලංකාරාමය

## නවසීලන්තය

හොඳයි එහෙනම් දැන් අපි අපේ ධර්ම සාකච්ඡාව ආරම්භ කරමු. සැම දෙනාටම තෙරුවන් සරණයි! දැන් අපි ආහාරපාන ගැනීමෙන් පසු සිද්ධ කරන ධර්ම සාකච්ඡාව. අදත් අපි සූත්‍ර කාණ්ඩයක් ඉදිරිපත් කරගෙන ධර්ම සාකච්ඡාවක් පවත්වනවා. මේ අද අපි කියලා දෙන්නා වූ සූත්‍ර කොටස් මේ පින්වත් සැම දෙනාටම ඉතාමත් හොඳින් පැහැදිලිව පිරිසිඳුව අවබෝධ වේවා! කියලා අපි මෛත්‍රියෙන් ප්‍රර්ථනා කරනවා. කිසිම ගැටලුවක් නැතුව ඒවාගේම කිසිම පීඩාවක් නැතුව ඒ පිළිබඳව සැකයක් නැතුව ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ අපේ ගෞරවණීය අතීත මහ රහතන්වහන්සේලා අතීත ගුරු ස්වාමීන්වහන්සේලා මහා සංඝරත්නය ජීවිත පරිත්‍යාගයෙන් කැප කරලා ආරක්ෂා කරගත්ත රැක ගත්ත ධර්මය මේ පින්වතුන් සැම දෙනාටම අද මේ වේලාවේ මේ ශාලාවේ හොඳට අහලා චිත්ත ප්‍රබෝධය ඇතිකරගෙන ප්‍රසාදණීය ධර්මය අහලා මෙනෙහි කරගෙන සැම දෙනාටම සැනසිලි නිවන් මගෙහි ගමන්කොට නිවනෙහි සැනසෙන්ට ලැබේවා!!!

අද මම මේ පින්වතුන්ට කියලා දෙන්න කැමතියි ඉස්සෙල්ලා කියල දීපු එකක continuation එකක්. මීට කලින් මම මේ පින්වතුන්ට කියලා දුන්නා 'අර්ථ' 'ධර්ම' 'නිරුක්ති' 'පටිභාන' කියන ධර්මතා ගැන. බෝධි පාක්ෂික ධර්ම තිබෙනවා 37ක්. සත්තිස් බෝධි පාක්ෂික ධර්ම වල 25 වගේ ප්‍රමාණයකට තමයි පටිසම්භිදා ඥාන ධර්ම ගලපලා තිබෙන්නේ. මීට කලින් මම කොටසක් කියලා දුන්නා. අද මම කියලා දෙනවා ඒකෙම තව කොටසක්. තථාගතයන්වහන්සේ කෙරෙහි ගෞරවය උපදවාගෙන මේ කාරණය දැනගන්න. මේ පින්වත් මහත්මයලා අපි සූත්‍රයක් තෝරලා දුන්නහම බොහොම සද්ධාවෙන් ඒවා ලස්සනට හරි ගස්සලා පින්වතුන්ට බෙදලා මහා ධර්ම සත්කාරයක් සිද්ධ කරනවා. අපි ඒක හරියට අගේ කරනවා.

අද මම කියල දෙන්නේ **'චතු පටිසම්භිදා ඤාණ ධර්ම'**. ලොව්තුරා බුදුරජාණන්වහන්සේ ධර්මය දේශනා කරන භාෂාව තමයි **මාගධී භාෂාව**. නමුත් අද කථා කරන්නේ **පාලි භාෂාව** කියලා. මගධයේ කථා කරපු යහපත් වූ ඒවාගේම කර්ණ රසායන වූ නිරවුල් වූ වෙනත් දේකට පාවිච්චි කරලා නොතිබුණා වූ භාෂාවක් තමයි තථාගතයන් වහන්සේ පාවිච්චි කරන්නේ. මේ භාෂාව අනිත් භාෂාවන්ට නැදෑකම් කියන්න පුළුවන්. නමුත් ඒ භාෂාව මගධයෙහි කථා කරපු භාෂාව. ඒ ගැනත් මේ පින්වතුන්ට මම සටහනක් කියලා දෙනවා. භාෂාවත් ඉගෙන ගන්න. අතීත සංස්කෘතියත් ඉගෙන ගන්න. පද හැදිලා තිබෙන විදියයි ඒ තුලින් ධර්මයයි, දෙකම ඉගෙන ගන්න.

ඉන්දියාවේ භාෂා තුනක් ප්‍රසිද්ධයි. ඒවා ප්‍රසිද්ධ ආගමික භාෂා හැටියට. තවත් භාෂා ගොඩක් තිබෙනවා. ඉන්දියාවේ ගොඩක් පත්තර තිබෙනවා. මම හිතන්නේ මගේ දැනුමේ හැටියට එක්දාස් ගානක් විතර තිබෙනවා තැන් තැන් වල කථාකරන භාෂාවල් (dialects). ප්‍රධාන වශයෙන් ගත්තු භාෂාවල් දෙසිය හතලිස් ගානක් තිබෙනවා.

ඉන්දියාවේ ප්‍රධාන භාෂා තුනක් තිබෙනවා.

1. **'සංස්කෘත භාෂාව'** - මේ භාෂාව පූජණීය භාෂාවක් ලෙස ගැනෙනවා. ඒකට කියනවා ඉතාම ඉහළින් පාවිච්චි කරපු සක්කත භාෂාව කියලා. වේදය ලියවිලා තිබෙන්නේ සංස්කෘත භාෂාවෙන්. සංස්කෘත භාෂාවෙන් ලියවුනු බෙහෙත් වට්ටෝරු වගේ දේවලුත් වේදයේ තිබෙනවා.

2. **'ප්‍රාකෘත භාෂාව'** - මේ භාෂාවත් වෙනත් දේවල් වලටත් පාවිච්චි කරලා තිබෙනවා නමුත් ප්‍රධාන වශයෙන් ජෛනයන්ගේ ජෛන ආගම ලියලා තිබෙන්නේ මේ භාෂාවෙන්. ජෛනයෝ කියන්නේ නිගණ්ඨයන්ට. සමහර වෙලාවට සංස්කෘත භාෂාවෙන් ලියවී තිබෙන දේවල් මේ ප්‍රාකෘත භාෂාවටත් පරිවර්තනය කරලා තිබෙනවා. මම දැකලා තිබෙනවා ධම්මපදයේ ගාථාවක් ප්‍රාකෘත භාෂාවෙන් ලියවිලා තිබෙනවා.

3. **'පාලි භාෂාව'** - තථාගත ධර්මය නොහොත් ත්‍රිපිටකය ධර්මය තිබෙන්නේ පාලි භෂාවෙන්. මේකට නම් කීපයක් තිබෙනවා. මේ භාෂාව මගධයේ කථා කරපු නිසා ඒකට කියනවා **'මාගධී භාෂාව'** කියලා.

මේ පාලි භාෂාවට කියනවා තවත් නමක්. මේවා රහස්. ඉන්දියාවට ගිහිල්ලා මහාචාර්යවරු  ඇසුරු කරනකොට තමයි මේවා තේරෙන්නේ. මමත් විශ්ව විද්‍යාලයක ඉගෙන ගත්තේ නැති උනාට පොඩි කාලයක් ඒ අය සමග සහ සම්බන්ධකම් පවත්වලා තිබෙනවා. ඒවා සහ පොත පතෙන් අපේ ගුරු ස්වාමීන්වහන්සේලා ඇසුරෙන් ඉගෙන ගත්ත දේවල් තහවරු කරගන්න මේ ළඟදිත් මට භාෂාවල් පිළිබඳව කථා කරන්න ඒ වගේ එක්කෙනෙක් හම්බ උනා.

පාලි භාෂාවට කියන තවත් නමක් තමයි **'මූල භාෂාව'** කියලා. මූල භාෂාව වීමට මෙහෙම හේතු තිබෙනවා. එකක් තමයි බුදුරජාණන්වහන්සේගේ ධර්මය දේශනා කරපු නිසා. අනිත් එක තමයි අනිත් භාෂාවල් හැදෙන්න මුල් වූ භාෂාව නිසා.

**'ආර්ය භාෂාව'** - ආර්යයන් වහන්සේලා ගැන කථා කරන, ආර්ය ධර්මය කථා කරන, ආර්ය තථාගත ධර්මය ප්‍රකාශ කරන්නාවූ භාෂාවක් නිසා මේකට **'ආර්ය භාෂාව'** කියලත් කියනවා.

**'ධර්ම නිරුත්ති'** - තථාගතයන්වහන්සේ දේශනා කළ ධර්මය ගැන කියන නිසා ධර්මයේ නිරුත්ති දක්වන නිසා පාලි භාෂාවට **'ධම්ම නිරුක්ති'** කියලත් කියනවා.

කවුරුත් හදන්නේ නැතුව ස්වභාවයෙන්ම මේ ශබ්ද හටගන්න නිසා මේ භාෂාවට **'සභාව නිරුක්ති'** කියලා කියනවා.

| | | |
|---|---|---|
| 1) සංස්කෘත භාෂාව | | |
| 2) ප්‍රාකෘත භාෂාව | } | ප්‍රධාන භාෂා තුන |
| 3) පාලි භාෂාව | | |

පාලි භාෂාව හඳුන්වන අනෙකුත් නම්

1) මගධ භාෂාව
2) මූල භාෂාව
3) ආර්ය භාෂාව
4) ධම්ම නිරුත්ති
5) සභාව නිරුත්ති

අපි හිතනවා සංස්කෘත භාෂාවෙන් පාලි හදුනා කියලා. ප්‍රාකෘති භාෂාවෙන් පාලි හැදුනා කියලා. නමුත් පාලි භාෂාවෙන් තමයි ඒ භාෂා දෙක හැදිලා තිබෙන්නේ. හැබැයි සංස්කෘතිය ගරු කරන එක්කෙනා කැමති නෑ පාලි භාෂාවෙන් සංස්කෘත හැදුනා කියලා කියන්න. ඒක නිසා කියනවා පාලි හැදුනේ සංස්කෘත භාෂාවෙන් කියලා. ඇත්ත තත්වය නම් කොහේටවත් බෙදෙන්නේ නැතුව කොහේටවත් පහත් වෙන්නේ නැතුව හිතුවොත් එහෙම පාලි භාෂාවෙන් තමයි සංස්කෘත හැදිලා තිබෙන්නේ. සමහරු කියනවා ප්‍රාකෘත භාෂාවෙන් පාලි හැදුනා කියලා. හේතුව ඒ ගොල්ලෝ කැමති නෑ පාලි භාෂාවෙන් ප්‍රාකෘත හැදුනා කියලා කියන්න. නමුත් ඇත්ත තත්වය නම් පාලි භාෂාවෙන් තමයි ප්‍රාකෘත භාෂාව හැදුනේ. ඒකයි පාලි භාෂාව මූල භාෂාව නමිනුත් හදුන්වන්නේ.

අපිට කවුරුහරි අත දුන්නොත් එහෙම නැගිටින්න අපි කියන්නේ නෑ අරය තමයි අත දුන්නේ කියලා. එතකොට අපේ තත්වෙට මදි කමක් වෙනවනේ. ඒක සාමාන්‍යයෙන් තිබෙන එකක්. මට බ්‍රාහ්මණ මහත්තෙයෙක් හම්බ වෙනවා. එයා බමුණෙක්. එහෙම මුණගැහුනහම උගත්කමක් තිබෙනවා කියලා දැන ගත්තහම මාතෘකා දෙකක් තිබෙනවා මම කථා කරන. එකක් තමයි භාෂාව අනිත් එක තමයි සීතා ගැන. හැබැයි සාමාන්‍ය ගමේ මිනුස්සුන්ගෙන් අහන්න හොඳ නෑ ඒක ගැන. සීතා ගැන කථා කරොත් අනිවාර්යෙන්ම රාවණා සම්බන්ධයි. රාමත් සම්බන්ධයි. භාෂාව ගැන දැනගන්න හොඳට ඉගෙන ගත්ත

එක්කෙනෙකුගෙන් අහන්න ඕන. ඒ බ්‍රාහ්මණ මහත්තයත් එක්ක මම භාෂාව කථා කළා. ඒ මහත්තයා මගෙන් ඇහුව 'ඔබ වහන්සේ කොහෙද? කොහෙද ඉගෙන ගත්තේ? මහණවෙලා කොච්චර කල්ද? කියලා එහෙම. ඉතින් මම කිව්වා අනිවාර්යෙන්ම පාලි ඉගෙන ගන්නවා සංස්කෘත ඉගෙන ගන්නවා කියලා. ඒ මහත්තය හරිම අවංක මහත්තයෙක්. බ්‍රාහ්මණ හින්දු කට්ටියගේ පූජනීය භාෂාව තමයි සංස්කෘත භාෂාව. සංස්කෘත භාෂාවෙන්ම කථා කරන සංස්කෘත භාෂාවෙන්ම කටයුතු කරන්නාවූ ගමක් තිබෙනවා අදටත් කර්ණාටක ප්‍රාන්තයේ. අදත් අපි සංස්කෘත ඉගෙන ගෙන ගියහම ඒ ගමේ කථා කරන්න පුළුවන්. පොඩි ළමයිනටත් සංස්කෘත භාෂාවෙන් කථා කරන්නේ, ඉංග්‍රීසි වගේ උගන්නනවා. ඒ ගොල්ලන්ගේ වේදය ලියවෙච්ච ඒ පූජනීය භාෂාව තමයි සංස්කෘත භාෂාව. හැබැයි ඒ මහත්තය කිව්වා 'ස්වාමීන්වහන්ස මිනුස්සු කියනවා සංස්කෘත භාෂාවෙන් පාලි හැදුනා කියලා, නමුත් ඇත්ත ඒක නොවෙයි සංස්කෘත ආවේ පාලියෙන්' කියලා කිව්වා. ප්‍රාකෘත ආවෙත් පාලියෙන්. ඒක තමයි නියම තත්වය. ඒ මහත්තය හොඳට ඉගෙන ගත්තු කෙනෙක්.

අනිත් එක තමයි සීතාගෙ ගනුදෙනුව. ඒ තමයි ඉන්දියාවේ හොඳට ඉගෙන ගත්තු මිනුස්සු රාමා සීතා ගැන විස්වාස කරන්නේ නෑ. ගමේ මිනුස්සු විස්වාස කරනවා. රාමා සීතා කියන්නේ මිත්‍යා කථාවක්. රාමා, සීතා, රාවණා කියන්නේ ජනප්‍රිය මාටින් වික්‍රමසිංහ මහත්තයගේ මඩොල්දූව වගේ එකක්. රාමා කියලා කියන්නේ මනංකල්පිත කථාවක්. සීතා කියන්නේ ලස්සනම ලස්සන කාන්තාවක්. මොන ජාතිකද? මනංකල්පිත ජාතික. කියන්නා කෙසේ කීවත් අපි හොඳට හොයලා බලලා දැනගන්න ඕන.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස පෙළ දහම කියල කියන්නේ මොකක්ද?

<u>පිළිතුර</u> - පළවෙනි දෙවෙනි තුන්වෙනි ආදී වශයෙන් සූත්‍ර පේළියක් දේශනා කරනවා. 'සූත්‍ර පංතියක්' 'සූත්‍ර පේළියක්' 'සූත්‍ර 50 පේළියක්' 'සූත්‍ර 100 පේළියක්' '1000 පේළියක්' ආදී වශයෙන් තිබෙනවා. දීඝ නිකායේ සූත්‍ර 34 ක පේළියක් තිබෙනවා. මජ්ඣිම නිකායේ සූත්‍ර 151 ක් තිබෙනවා. සංයුත්ත නිකායේ සූත්‍ර හත්දහස් ගණනක් තිබෙනවා. ඔය විදියට සූත්‍ර පේළි

තිබෙන්නේ. ඒ 'සූත්‍ර පේළියකට' 'සූත්‍ර කොටසකට' 'සූත්‍ර පන්තියකට' කියන්නේ පාලිය කියලා.

ඊළඟට තිබෙන සූත්‍රයේ මුල් කොටස මම කලින් කියලා දුන්නා. අද තිබෙන්නේ සති බොජ්ඣංගයේ ඉඳලා කියලා දෙන්න. බොජ්ඣංග 7 මුල් කරගෙන කියලා දෙන්නේ 'පටිසම්භිදාඥාණ ධර්මයි'. නමස්කාරය කියලා පටන් ගමු.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

මෙහෙමයි තිබෙන්නේ

**'සතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො ධම්මො, වීරියසම්බොජ්ඣඞ්ගො ධම්මො, පීතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, සමාධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ධම්මො. අඤ්ඤො සතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො වීරියසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො පීතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො සමාධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ධම්මො. යෙන ඤාණෙන ඉමෙ නානා ධම්මා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා ධම්මා පටිවිදිතාති. තෙන වුච්චති – ''ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං''**

**'සතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො ධම්මො, වීරියසම්බොජ්ඣඞ්ගො ධම්මො, පීතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, සමාධිසම්බොජ්ඣඞ්ගො ධම්මො,**

**උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ධම්මො’ -** දැන් මෙතන ධර්ම කීයක්ද? ධර්ම 7 යි. ‘සති’ ‘ධම්ම විචය’ ‘විරිය’ ‘ප්‍රීති’ ‘පස්සද්ධි’ ‘සමාධි’ ‘උපේඛා’. මේවා ධර්ම.

හොඳට බලන්න ඊළඟට තිබෙනවා **අඤ්ඤො සතිසම්බොජ්ඣඞ්ගො ධම්මො** = සති සම්බොජ්ඣංගය කියන ධර්මය අනෙකක් = වෙනත් එකක්.

**අඤ්ඤො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො** = ධම්ම විචය සම්බොජ්ඣංගය අනෙකක්.

**අඤ්ඤො වීරියසම්බොජ්ඣඞ්ගො ධම්මො** = වීරිය සම්බොජ්ඣංගය අනෙකක්.

**අඤ්ඤො පීතිසම්බොජ්ඣඞ්ගො ධම්මො** = පීති සම්බොජ්ඣංගය අනෙකක්

**අඤ්ඤො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො ධම්මො** = පස්සද්ධි සම්බොජ්ඣංගය අනෙකක්.

**සමාධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො** = සමාධි සම්බොජ්ඣංග ධර්මය අනෙකක්.

**අඤ්ඤො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ධම්මො** = උපේක්ඛා සම්බොජ්ඣංග ධර්මය අනෙකක්

දැන් මෙතන ධර්ම හතක් දේශනා කළා. ඒ ධර්ම හත තව දුරටත් පැහැදිලි කරමින් පටලවා ගැනීමක් කරන්නේ නැතුව මේ ධර්ම වෙන වෙන ධර්ම හතක් බව පැහැදිලි කිරීමට තමයි මේ **‘අඤ්ඤො’** කියන පදය යොදලා දේශනා

කරන්නේ. ඒක, පාලි භාෂාවේ තිබෙන්නා වූ එහෙම නැත්නම් දේශනාවේ තිබෙන්නාවූ තහවරු කිරීමේ සහ පටලැවිල්ලක් නැති කිරීමේ එක්තරා ක්‍රමයක්.

ඒක සමහර විට මෙන්න මෙහෙමත් තිබෙනවා. 'මනුස්සයා ගියා' කියලා කියලා 'මනුස්සයා එතන නැවතුනේ නෑ' කියලා ආයේ එකකුත් කියනවා. ඉතින් නැවතුනේ නැත්නම් ගියා වෙනවා. එතකොට දෙවිදියකින් කියලා තිබෙනවා. මෙතන ධර්මතාවයන් හතක් කියලා නැවත මේවා වෙන වෙන ධර්ම කියලා හොඳට පැහැදිලිව කියලා දෙනවා.

ඊළඟට තිබෙනවා මෙහෙම.

**යෙන ඤාණෙන** = යම් ඥානයකින්

**ඉමෙ නානා ධම්මා ඤාතා** = මේ වෙනස් වෙනස් ධර්ම දැන ගත්තේද,


**තෙනෙව ඤාණෙන** = ඒ ඥානයෙන්ම

**ඉමෙ නානා ධම්මා පටිවිදිතා** = ධර්ම නානත්වය, ධර්මයන්ගේ තිබෙන වෙනස් කම හොඳට තේරුම් ගත්තා - අවබෝධ කරගත්තා

**තෙන වුච්චති – ''ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං'' .**

'සති' 'ධම්ම විචය' 'වීරිය' 'පීති' 'පස්සද්ධි' 'සමාධි' 'උපේක්ඛා' යන බොජ්ඣංග ධර්ම එකිනෙකට වෙනස් ධර්ම නිසා ඒවා එකිනෙකට වෙනස් ධර්ම හැටියට දේශනා කළා.

දැන් එක්තරා ඥානයක් තිබෙනවා බලන්න.




දැන් මේ ඥානයෙන් **'සති' 'ධම්මවිචය' 'විරිය' 'පීති' 'පස්සද්ධි' 'සමාධි' 'උපේක්ඛා'** යන සියලුම ධර්මයන් ඉතා පැහැදිලිව දැන ගන්නවා. ඒකට කියනවා **'පටිවිදිතා'** කියලා. **'පටිවිදිතා'** = අවබෝධ කරගත්තා = තේරුම් ගත්තා යනුයි.

ඒක නිසා මේ ධර්මයන් දැන ගන්නාවූ ඥානයට කියනවා **'ධම්මනානත්තෙ ඤාණය'** නොහොත් **'ධම්මපටිසම්භිදා ඤාණය'** කියලා.

දැන් මේ 'ධම්මපටිසම්භිදා ඤාණයෙන්' පුලුවන්ද අර්ථය දැන් ගන්න? බැහැ. මේකෙන් පුළුවන් ධර්මයන්ගේ වෙනස් බව දැන ගැනීමට පමණයි.

මේ ධර්ම තුල තිබෙනවා ඒවාට ආවේනික වෙච්ච, ඒ ධර්ම වලටම සුදුසු, ඒ ධර්ම වලට පමණක්ම අදාළ විශේෂිත වූ ක්‍රියා ගුණයක්. මම මේ කියන දේ මේ පින්වතුන් හොඳට තේරුම් ගන්න. **'සති'** කියන ධර්මයට තිබෙනවා ඒකටම පමණක් කරන්න පුළුවන් වැඩ කටයුත්තක්, ඒකටම විතරක් කරන්න පුළුවන් ක්‍රියාවක්, ඒකට පමණක් කරන්න පුළුවන් දෙයක් තිබෙනවා. ඒ ගුණය 'ධම්ම

විචය' එකේ නෑ. 'වීරිය' එකෙත් නෑ. ඒ ක්‍රියාව තිබෙන්නේ 'සතිය' කියන ධර්මයේම පමණයි. මේ බොජ්ඣංග ධර්ම 7 ටම තිබෙනවා එක එකට අදාළ වෙන වෙන විශේෂිත ක්‍රියා ගුණයක්, ක්‍රියා ශක්තියක්, ක්‍රියත්මක වෙන්න පුළුවන් ධර්ම ශක්තියක් තිබෙනවා. ඒ ධර්ම ශක්තියට එනම් ඒ ක්‍රියාත්මක ගුණයට අපේ භාෂාවෙන් මම මේ පින්වතුන්ට කථා කරලා කියල දෙන එක ගත්තොත් එහෙම මම පාවිච්චි කරන වචනය තමයි **'ක්‍රියා'**. ඒ කියන්නේ මේ බොජ්ඣංග ධර්ම ඇතුලේ තිබෙනවා 'ක්‍රියාවක්'. නමුත් ධර්මයේ ඒකට කියන්නේ **'අර්ථය'** කියලා. දැන් බලන්න මෙහෙම තිබෙනවා.

**උපට්ඨානට්ඨො අත්ථො, පවිචයට්ඨො අත්ථො, පග්ගහට්ඨො අත්ථො, ඵරණට්ඨො අත්ථො, උපසමට්ඨො අත්ථො, අවික්ඛෙපට්ඨො අත්ථො, පටිසඞ්ඛානට්ඨො අත්ථො. අඤ්ඤො උපට්ඨානට්ඨො අත්ථො, අඤ්ඤො පවිචයට්ඨො අත්ථො, අඤ්ඤො පග්ගහට්ඨො අත්ථො, අඤ්ඤො ඵරණට්ඨො අත්ථො, අඤ්ඤො උපසමට්ඨො අත්ථො, අඤ්ඤො අවික්ඛෙපට්ඨො අත්ථො, අඤ්ඤො පටිසඞ්ඛානට්ඨො අත්ථො. යෙන ඤාණෙන ඉමෙ නානා අත්ථා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා අත්ථා පටිවිදිතාති. තෙන වුච්චති – ''අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං''.**

**උපට්ඨානට්ඨො අත්ථො** = උපට්ඨාන වීම එක්තරා අර්ථයක් - මෙතැන **'අර්ථය'** යන පදයේ තේරුම් **'ක්‍රියා අර්ථයයි'.**

**පවිචයට්ඨො අත්ථො** = සොයා බැලීම නම් වූ ක්‍රියා ස්වරූප යයි - අර්ථයයි.

**පග්ගහට්ඨො අත්ථො** = යොමු කිරීම නම් වූ - මෙහෙය වීම නම් වූ ක්‍රියා ස්වභාව යයි

**ඵරණට්ඨො අත්ථො** = පැතිරවීම නම් වූ ක්‍රියා අර්ථයයි

**උපසමට්ඨො අත්ථො** = සංසිදීම නම් වූ ක්‍රියා අර්ථයයි

**අවික්ඛෙපට්ඨො අත්ථො** = විසිරෙන්න නොදී තබා ගැනීම නම් වූ ක්‍රියා අර්ථයයි.

**පටිසඞ්ඛානට්ඨො අත්ථො** = පැත්තකට බර වෙන්න නොදී දැන ගැනීම නම් වූ ක්‍රියා අර්ථයයි. උපේක්ඛා සහගත වීමේ ලක්ෂණය.

මෙතැන තිබෙනවා ක්‍රියාකාරකම් 7ක්. මේ ක්‍රියා කාරකම් කියලා කියන්නේ ධර්ම ක්‍රියාකාරකම්. මේවා තිබෙන්නේ පෙර සඳහන් කල බොජ්ඣංග ධර්ම තුලයි.

**‘උපට්ඨාන’ අර්ථය** (ක්‍රියාව) = යොමුවීම.

මෙය තිබෙන්නේ **‘සතිය’** තුලයි. සතියට බැ සොයා බලන්න. සතියට පුළුවන් කම තිබෙන්නේ ‘යොමුවීමට’ පමණයි. **‘උපට්ඨාන’** අර්ථය කියලා කියන්නේ යොමු වෙන එකටයි. යම්කිසි අරමුණකට හැරෙනවා, යොමුවෙනවා. ඒ හැරෙන යොමුවෙන ක්‍රියා ස්වරූපය තිබෙන්නේ සතියට පමණයි. ‘ධම්ම විචය’ ‘වීරිය’ ආදී අනෙක් ධර්ම වලට ඒ යොමු වීමේ ගතිය නෑ.

**‘පවිචය’** අර්ථය (ක්‍රියාව) = විමසීම.

ආරම්මණයේ යථා ස්වභාවය සොයලා සොයලා තරාතිරම් බලන මේ ගතිය තිබෙන්නේ **‘ධම්ම විචය’** තුල. මෙම සොයා බැලීම ‘ධම්ම විචය’ තුල තිබෙන්නාවූ ධර්ම ක්‍රියාවක්.

**‘පග්ගහට්ඨ’ අර්ථය**’(ක්‍රියාව) = බලගැන්වීම **-** එසවීම.

පග්ගහට්ඨ කියලා කියන්නේ අනෙක් ධර්ම වලට ගැම්ම දෙන ශක්තියක් දෙන ක්‍රියාව. ‘ධම්ම විචයට’ යන්න හයියක් ගැම්මක් අවශ්‍යයයි. ආරම්මණයේ ධර්මයන් හසුරුවන්න බලය යොදන්නා වූ ගතිය තමයි මේ ‘පග්ගහට්ඨ’ නම් වූ වීර්ය.

**‘ඵරණට්ඨ’ අර්ථය**’ (ක්‍රියාව) = පැතිරවීම. **‘ඵරණට්ඨ’** කියලා කියන්නේ පතුරුවන ගතිය. පීතියේ තිබෙන්නේ සෞම්‍ය වෙලා පැතිරෙන ඒ වාගේම සතුට පතුරුවන ගතිය. මේක තිබෙන්නේ පීතියේ විතරයි.

**‘උපසමට්ඨ’ අර්ථය** (ක්‍රියාව) = සංසිඳීම.

**‘අවික්ඛෙප’ අර්ථය** (ක්‍රියාව) = නොවිසිරෙන ගතිය = සමාධිය

**'පටිසඞ්ඛාන' අර්ථය'** (ක්‍රියාව) = සමව බැලීම.

මේ ක්‍රියා ස්වරූප හත **'සති'** **'ධම්ම විචය'** **'වීරිය'** **'පීති'** **'පස්සද්ධි'** **'සමාධි'** **'උපේක්ඛා'** යන ධර්ම තුල තිබෙන්නාවූ ක්‍රියා කාරී ස්වභාවයන්. මේක හරියට තේරුම් ගන්නවා නම්, මිරිස් වල තිබෙන 'සැර ගතියයි' 'මිරිසුයි' වගේ. ඒ දෙක දෙකක්. සැර ගතිය තිබෙන්නේ මිරිස් වල. මේ සැර ගතියයි මිරිසුයි දෙකක් උනාට ඒ දෙක තිබෙන්නේ එක තැනක. ඒ වගේ 'සතිය' කියන්නේ එකක්, ඒකෙ තිබෙන 'ක්‍රියාව' වෙන එකක්. 'සතිය' කියන්නේ 'ධර්මයක්'. සතියේ තිබෙන්නාවූ 'ක්‍රියාකාරී' ස්වභාවය තව එකක්. දැන් මෙහෙම බලන්න. එක මනුස්සයෙක් ඉන්නවා. ඒ මනුස්සය යනවා. ඒ 'මනුස්සයයි' ඒ මනුස්සයගේ 'යෑමයි' එකක්ද දෙකක්ද? දෙකක්. ඒ 'යෑම' කියන ක්‍රියාව මනුස්සයට බද්ධ වෙලා තිබෙන්නේ. ඒවගේ **'සතිය'** කියන එකට අදාළ ක්‍රියාවක් තිබෙනවා. ඒවගේ මේ ධර්ම හත බොජ්ඣංග ධර්ම තුල තිබෙන්නාවූ **'ධර්ම අර්ථ හතක්'.**

ඊළඟට තිබෙනවා මෙහෙම .

**අඤ්ඤො උපට්ඨානට්ඨො අත්ථො** = යොමු වීමේ ක්‍රියා අර්ථය එකක්

**අඤ්ඤො පවිචයට්ඨො අත්ථො** = විමසීමේ ක්‍රියාකාරී අර්ථය එකක්

**අඤ්ඤො පග්ගහට්ඨො අත්ථො** = වීරිය අර්ථය වෙනත් එකක් එකක්

**අඤ්ඤො ඵරණට්ඨො අත්ථො** = පැතිරවීමේ අර්ථය වෙන එකක්

**අඤ්ඤො උපසමට්ඨො අත්ථො** = සංසිඳීමේ අර්ථය වෙන එකක්

**අඤ්ඤො අවික්ඛෙපට්ඨො අත්ථො** = අවික්ෂේප භාවයට පත්වීම තවත් එකක්

**අඤ්ඤො පටිසඞ්ඛානට්ඨො අත්ථො** = සමව බැලීමේ අර්ථය තව එකක්

ඊළඟට තිබෙන දේ බලන්න,


**යෙන ඤාණෙන ඉමෙ නානා අත්ථා ඤාතා** = යම් කිසි ඥානයකින් මෙහි නා නා ක්‍රියා ස්වභාවය දැන් ගත්තේද,

**තෙනෙව ඤාණෙන ඉමෙ නානා අත්ථා** පටිවිදිතාති = ඒ ඥානයෙන්ම එහි ඇති විවිධත්වය තේරුම් ගත්ත නිසා

**තෙන වුච්චති – ‘‘අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං’’** = ඒ නිසා (තෙන වුච්චති) කියනවා අර්ථයේ තිබෙන විවිධත්වය දැන ගන්නා නුවණ හෙවත් **‘අත්ථපටිසම්භිදෙ ඤාණය’** යනුවෙන්.

ඒ කියන්නේ තවත් ඥානයකින් බලනවා මේ ධර්ම තුල තිබෙන්නාවූ ‘අර්ථය’. මිරිස් ගැන දැන ගැනීමයි මිරිස් වල සැර ගතිය දැන ගැනීමයි කියන්නේ දෙකක්. ඉස්සෙල්ලා ‘සති’ ‘ධම්ම විචය’ ‘වීරිය’ ‘පීති’ ‘පස්සද්ධි’ ‘සමාධි’ ‘උපේක්ඛා’ යන ධර්ම ‘ධම්මපටිසම්භිදා ඤාණයෙන්’ දැක ගත්තා. දැන් මේ අවස්ථාවේදී තවත් ඥානයකින් ඒ ධර්ම තුල තිබෙන්නාවූ ‘අර්ථය’ එනම් ‘ක්‍රියා ස්වරූපය’ බලනවා. ඒ ධර්ම වල අර්ථය බලන්නාවූ ඒ ඥානය **‘අත්ථපටිසම්භිදා ඤාණය’** නම් වෙනවා.

මේ ගැන අපේ මට්ටමෙන් හිතුවොත්, අපිට මිරිස් පෙන්නේ දිවටද? ඇහැටද? මිරිස් පෙන්නේ ඇහැට. මිරිස් දැනේන්නේ දිවට. මිරිස් ගැන දැන ගැනීමේදී මේ වගේ දෙපැත්තකට යොමුවෙනවා. ඒ වාගේම මෙහිදීත් ධර්මය දැන ගැනීමයි අර්ථය දැන ගැනීමයි සිදු වෙන්නේ ඥාන දෙකකින්. ‘ධම්මපටිසම්භිදා ඤාණයෙන්’ ‘ධර්ම’ දැන ගන්නවා. ‘අත්ථපටිසම්භිදා ඤාණයෙන්’ ‘අර්ථය’ දැන ගන්නවා.




දැන් **‘ධම්මපටිසම්භිදා ඤාණයෙන්’** දකින්නේ මොකක්ද? ‘ධර්මය’. **‘අත්ථපටිසම්භිදෙ ඤාණයෙන්’** දකින්නේ මොකක්ද? ‘අර්ථය’.

අර්ථය කියන්නේ මොකක්ද? යම් කිසි ධර්මයක් තුල තිබෙන්නාවූ ක්‍රියාත්මක වීමේ ස්වභාවය.

මේ ධර්මය හොඳ ලස්සනට වචනයෙන් වචනය කියලා දීලා තිබෙනවා. ඒක නිසා මේ පින්වතුන් හොඳට මේක දැන් ගන්න.

දැන් මෙතැන ධර්ම කීයක් තිබෙනවද? හතයි.
අර්ථ කීයක් තිබෙනවද? හතයි.

දැන් ඊළඟ කොටස බලන්න.

| |
|---|
| **සත්ත ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, සත්ත අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා. අඤ්ඤා ධම්මනිරුත්තියො, අඤ්ඤා අත්ථනිරුත්තියො. යෙන ඤාණෙන ඉමා නානා නිරුත්තියො ඤාතා, තෙනෙව ඤාණෙන ඉමා නානා නිරුත්තියො පටිවිදිතාති. තෙන වුච්චති – "නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං".** |

**සන්දස්සෙතුං** කියලා කියන්නේ පෙන්වා දෙනවා කියන එකයි.

**සත්ත ධම්මෙ සන්දස්සෙතුං** = ධර්ම හතක් පෙන්වාදීමටත්

**බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා** = ධර්ම හතක් කියලා දෙන්න 'යම් කිසි වචනයක්, භාෂාවක්, වාක්‍යයක්, යම් කිසි ප්‍රකාශනයක් වෙයිද'...

(දැන් 'සතිය' කියලා යම් කිසි ධර්මයක් තිබෙනවා. දැන් මේ ධර්මය 'සතිය' කියලා කියන්න යම් කිසි වචනයක් ඕකට ගැටගහන්න ඕන. 'ධම්ම විචය' කියලා කියන්න 'වීරිය' කියලා කියන්න මේ ධර්ම වලට මොකක් හරි වචනයක් ගැට ගහන්න ඕන. දැන් අපිට 'සති' 'ධම්ම විචය' 'වීරිය' 'පීති' 'පස්සද්ධි' 'සමාධි' 'උපේක්ඛා' කියලා වචන හතකින් තමයි ඒ ධර්ම ටික අපිට ගොනු කරලා දෙන්නේ. දැන් මේ ධර්ම හත පෙන්නන වචන හතකුත් භාෂා විලාස හතකුත් අවශ්‍යයි. එතකොට මෙතන තිබෙනවා **'සත්ත ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා'** කියලා. ඒ කියන්නේ 'ධර්මතා හතක් පෙනෙන්න භාෂා වචන හතකුත්' කියන එකයි).

**සත්ත අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා** = ඒ ධර්ම වල තිබෙන අර්ථය දක්වන්න තව වචන හතකුත්,

**අඤ්ඤා ධම්මනිරුත්තියො** = ධර්මය පෙන්නන්න පාවිච්චි කරපු භාෂාව වෙනයි

**අඤ්ඤා අත්ථනිරුත්තියො** = ඒ ධර්ම වල තිබෙන්නාවූ අර්ථය පෙනන්න පාවිච්චි කරපු වචන වෙනයි

**යෙන ඤාණෙන ඉමා නානා නිරුත්තියො ඤාතා, තෙනෙව ඤාණෙන ඉමා නානා නිරුත්තියො පටිවිදිතාති. තෙන වුච්චති – ''නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං''**. = යම් කිසි නුවණකින් යම් කිසි භාෂා දැනුමකින් අර්ථයට කියන වචන වෙනයි, ධර්මයට කියන වචන වෙනයි කියලා ඒ වචන වෙන වෙනම තේරුම් ගැනීමේ ඥානයට කියනවා 'නිරුක්ති නානත්වය දැන ගන්නා නුවණ' කියලා. මෙය 'නිරුත්තිපටිසම්භිදා ඤාණය' නම් වෙනවා.

<u>ප්‍රශ්නයක්</u> - මේ දහම අපි තේරුම් ගන්න ක්‍රමය හෝ කාට හරි කියලා දෙන ක්‍රමයටද කියන්නේ නිරුක්තිය කියලා?

<u>පිළිතුර</u> - නිරුක්තිය කියන්නේ අපි පාවිච්චි කරන වචනය. සංකේතාත්මක ප්‍රඥප්තිය. ඒ අපි කියන්න යන දේ ගැන කථා කරන්න සම්මත කරගෙන තිබෙන්නා වූ වචනයට කියනවා නිරුක්තිය කියලා.

අපි හිතමු මෙහෙම. වනාන්තරේ ගහක් තිබෙනවා. ඒ ගහ කවුරුවත් දැකලා නෑ. ඔහේ තිබෙනවා. ඒ ගහේ ගෙඩිත් තිබෙනවා. රසයි. හොඳයි. කවුරු හරි වනාන්තරේට ගිය මනුස්සයෙක් ඔය ගහ දකිනවා. එතකම්ම මෙයා ඒ ගහ දැකලා තිබුණේ නෑ. වෙන කෙනෙක් දැනගෙනත් නෑ. දැන් එයා ඒ ගහේ තිබෙන ඒ පළතුරු කනවා. දැන් එතකොට එයා ගහ දැක්කා. ගහේ පළතුරුත් කෑවා. දැන් මෙයා මේක ගමට ඇවිල්ලා කියනවා. එතකොට එයාට ගහ ගැන කියන්න වෙනවා. ගහ ගැන කියන්න එයා මොකක් හරි වචනයක් පාවිච්චි කරනවා. මොකක් හරි වගේ කියලා හරි අඹ වගේ කියලා හරි ජම්බු වගේ කියලා හරි මොකක් හරි වචනයක් එයා දානවා. ඒ ගහට වචනයක් ඉස්සෙල්ලාම භාවිතා වෙන තැන තමයි මේ. ඊට පස්සේ ඒ කාපු ගෙඩි ජාතිය ගැනත් එයා කියනවා. එතකොට එයාට සිද්ධ වෙනවා නේද ඒ ගහේ හැටි

කියන්න. ඒ ගහේ කාපු ගෙඩි ගැනත් කියන්න සිද්ධ වෙනවා නේද? එතනත් මොකක් හරි රසකට ඇඳලා කියන්න සිද්ධ වෙනවා නේද? එතකොට නේද එයාට ඉසේල්ලාම ඒ ගහට භාෂාවක් දාන්න වෙන්නේ. දැන් එතකොට එතනට භාෂාවක් පාවිච්චි කරන්න වෙනවා. එතකොට ඒ වචනය ගහ නොවෙයි. ඒ වචනය ගෙඩිත් නොවෙයි. එතකොට ඒ වචනය පාවිච්චි කරලා තිබෙන්නේ ගහෙන් අනෙකකටත් නොවෙයි. ගෙඩි වලින් අනෙකකටත් නොවෙයි. එයා ගමට ගිහිල්ලා ඒ වචනය පාවිච්චි කරන්නේ අර ගහට ඇඳලයි. ඒ වචනය පාවිච්චි කරන්නේ ඒ ගෙඩි වලට සම්බන්ධ කරලා. එතකොට මේ වචනය එයා දුර ගිහිල්ලා කථා කරාට ඒ ගහට සම්බන්ධයි. එතකොට බලන්න එයා ගිහිල්ලා ඒ ගහ ගැන කියනවා. ගහට වචනයක් දෙනවා. එතකොට ඒකට කියනවා ‘ගහට දාපු වචනය’ කියලා. ඊළඟට ගෙඩි වල රසයට වචනයක් කියනවා. ඒකට කියනවා ‘ගෙඩි වල රසයට දාපු වචනය’ කියලා. දැන් එතකොට ගහකුත් තිබෙනවා ගෙඩිත් තිබෙනවා ඒ දෙකට දාපු වචන දෙහෙකුත් තිබෙනවා. කවදාකවත් එයා ගහ පටලවා ගන්නේ නැහැ ගෙඩි වලට. ගෙඩි පටලවා ගන්නේ නැහැ ගහට.

ආන්න ඒ වගේ තථාගතයන් වහන්සේ අවබෝධ කරගන්නවා ධර්මයක්. ඒ අවබෝධ කරගත්ත ධර්මය උන්වහන්සේගේ ගැඹුරු නුවණින් පිරිසිදු නුවණින් හුදකලාවේ වැඩහිඳගෙන සමාධි ගත සිතින් ධර්ම ස්වභාව දැන ගන්නවා. හොඳට ධර්ම ගොඩාක් දැන ගන්නවා. ඒ උන්වහන්සේගේ ඥානයෙන් දැනගත්ත දේවල් තිබෙනවා වර්ග දෙකක්. මොකක්ද ඒ දෙක? උන්වහන්සේ ‘ධර්මයත්’ අවබෝධ කරගන්නවා. ධර්මයේ තිබෙන්නාවූ ‘අර්ථයත්’ දැන ගන්නවා, එනම් ක්‍රියාවත් දැන ගන්නවා. ධර්මතා දෙකක් දැන ගන්නවා. එතකොට උන්වහසේට ධම්ඥාණයත් තිබෙනවා අර්ථඥාණයත් යන දෙකම තිබෙනවා. උන්වහන්සේට පුළුවන් ‘මේක තමයි සතිය’ ‘ඒකෙන් කෙරෙන්නේ මේකයි’ කියලා දැන ගන්න. ‘වීරිය මේකයි’ කියලා දකිනවා, වීරියෙන් කෙරෙන්නේ මේකයි කියලත් දැන ගන්නවා. එතකොට ධර්මයත් දකිනවා ධර්මයේ ක්‍රියා අර්ථයත් දකිනවා. දැන් උන්වහසේ ධම්ඥාණයත් අර්ථඥාණයත් ලබාගෙන දේශනා කරන්න යනවා. දේශනා කරනකොට අර්ථයට හානියක් නොවෙන විදියට ධර්මයට හානියක් නොවෙන විදියට ක්‍රියාවට ගලපලා ලස්සන නොකැළැල් නිස්කලංක වචන පෙළකින් අර ටික පැහැදිලිව කෙනෙකුට දේශනා කරනවා. ඒ දේශනා කරන විදිය තමයි ‘සතිය’ කියන වචනය ‘ධම්ම විචය’ කියන වචනය. ‘වීරිය’ ‘පීති’ ‘පස්සද්ධි’ ‘සමාධි’ ‘උපේක්ඛා’ යන වචන. ඒ අර ධර්ම හඳුන්වන්න දාපු භාෂා වචන

ටික. දැන් අපි ධර්මය ඉගෙන ගන්නේ භාෂාවෙන්. බුදුරජාණන්වහන්සේ ඉස්සෙල්ලාම ධර්මය දැකලා රහ බලලා අර්ථය දැනගෙන ඒක ඊට පස්සේ ඒවා භාෂාගත කළා. උන්වහන්සේට ඒ හැකියාව තිබෙනවා. මේක මේ විදියට වාර දෙහෙකට විස්තර කරාට මේ සියල්ල ඇතිවන්නේ එකටයි. ඉස්සෙල්ලා 'අර්ථය' 'ධර්මය' දැනගෙන පස්සේ 'නිරුක්තිය' එනවා කියන එක නොවෙයි. උන්වහන්සේට දේශනා කිරීමේ ඥානය තිබෙනවා.

දැන් මේ විදියට ධර්මය දැන ගත්තා, ඒවගේ තිබෙන අර්ථය දැන ගත්තා. දැන් උන්වහන්සේ ධර්මය කියලා දෙනවා. "මෙහෙම 'සතිය' කියල ධර්මයක් තිබෙනවා. මහණෙනි, 'ධම්ම විචය' කියලා එකෙකුත් ඔතන තිබෙනවා. 'වීරිය' කියලා එකකුත් තිබෙනවා. 'පීතියත්' 'සමාධියත්' තිබෙනවා. 'පස්සද්ධිය' 'උපේක්ෂාව' තිබෙනවා" කියලා ඒවා තුල තිබෙන ක්‍රියාකාරී ස්වභාවයක් වෙනත් වචන ටිකකින් කියලා දෙනවා. එතකොට උන්වහන්සේට ධර්මය කියලා දෙන්න වචන හතක් පාවිච්චි කරන්න වෙනවා. ඒකෙ ක්‍රියාකාරී ස්වරූපය කියලා දෙන්න වෙනත් වචන 7 ක් දේශනා කරනවා. ආන්න ඒ දැනුමට කියනවා - භාෂාව පදය ගලපන්න පුළුවන් ඒ ඥානයට කියනවා **'නිරුත්තිපටිසම්භිදා ඤාණය'** කියලා.

<u>ප්‍රශ්නයක්</u> - එතකොට ස්වාමීන්වහන්ස ඔය වචන ඒ කාලේ තිබුන වචනද බුදුහාමුදුරුවෝ පාවිච්චි කළේ?

<u>පිළිතුර</u> - මෙහෙමයි තිබෙන්නේ. මේවා ආර්යන්වහන්සේලා පාවිච්චි කරන ආර්ය භාෂාවල්. තථාගතයන්වහන්සේලා පහළ වෙන කාලවලට ඒක ස්වභාවයෙන්ම ලෝකයට මතු වෙනවා. පෙර බුදුවරු පාවිච්චි කරපු, ආර්යන් වහන්සේලා පාවිච්චි කරපු, බ්‍රහ්මයෝ පාවිච්චි කරපු භාෂා වචන ඔය. ඕවා බ්‍රහ්මලෝකයේ නම් තිබෙනවාලු. බ්‍රහ්මලෝකේ බ්‍රහ්මයෝ ආමන්ත්‍රණය කරන්නාවූ භාෂාවක් හැටියට තිබෙනවා. හැබැයි මනුෂ්‍යලෝකේ ඕක පැලවෙලා සමාජ ගතවෙන්න කාලයක් යනවා. නැත්නම් අනිත් කාලවල ඒවා එහෙම උඩට එන්නේ නැහැ. හැබැයි ලෝකේ මනුස්සයෝ ඕවා පාවිච්චි කරන්නව වෙන වෙන දේවල්වලට. ඒ මතු වෙච්ච කාලේ උනත් වෙන වෙන දේවල් වලට පාවිච්චි කරලා ඔහේ තිබෙනවා. නමුත් තථාගතයන් වහන්සේ පහළ උනහම දේශනා කරනවා "ඔය වචන ඕවාට කියන එවා නොවෙයි , මෙහෙමයි ඒක පාවිච්චි කරන්නේ" කියලා හරි දේට යොදලා දෙනවා.

සූත්‍රයක් තිබෙනවා මජ්ඣිම නිකායේ. **'ආරෝග්‍යා පරමා ලාභා'** කියන එකෙන් කියන්නේ කය ගැන නොවෙයි. මානසික සුවය - මානසික නිරෝගී කම ගැනයි ඒකෙන් කියන්නේ. ඒක මිනුස්සු අතට ගිහිල්ලා ඒ ගොල්ලෝ ඒ වචන පාවිච්චි කරන්නේ fitness ගැන කථා කරන්න. cholesterol අඩුවෙන ඒවා ගැන health එක ගැන කියන්න වගේ බොහොම නොවටිනා දේවල් වලට. පෘතක්ජනයන් අතරට ආර්ය භාෂාවක් ගියාට පස්සේ, ආර්යන් වහන්සේලා කථාකරන දේවල් යමක් නොදන්නාවූ අය අතරට ගියාට පස්සේ ඒ වචන නොවටිනා අයුරිනුයි පාවිච්චි වෙන්නේ. ඒකයි වෙන්නේ. හැබැයි **'ආරෝග්‍යා පරමා ලාභා'** කියන එකේ නියම අර්ථය තිබෙන්නේ ඇඟේ නොවෙයි හිතේ. හිතේ තිබෙන කෙලෙසුත් එක්කයි ඒක යෙදෙන්නේ. හිතේ, කෙලෙස් තිබෙන තැන රෝගීයි, කෙලෙස් නැති තැන නිරෝගීයි. බුදුරජාණන්වහන්සේ මේ ශරීරයට තුට්ටුවක වටිනා කමක් දීලා නෑ.

දැන් බලන්න මෙහෙම. මේ පාරවල් දිගේ යනකොට hairdressing centers - health care centers - beauty parlors වගේ කය ලස්සන කර ගන්න තැන් කීයක් තිබෙනවද? නමුත් බලන්න mental care කීයක් තිබෙනවද කියලා. දැන් මේ පන්සල්, සේනාසන, ආරාම කෙලින්ම මනස සම්බන්ධයෙන් කථා කරන ස්ථාන. ඇත්තටම කිව්වොත් මේවා mental care centers. තථාගතයන් වහන්සේ මනස ගැනයි කථා කළේ. ඒක නිසා මේ සේනාසන ඒවාගේම භාවනා මධ්‍යස්ථාන ආරාම වල හැම එකකම නියම තථාගත ධර්මය කථා කරනවා නම් කථා කළ යුත්තේ මනස ගැනයි. **ආරෝග්‍යා පරමා ලාභා** කියලා කියන්නේ මනසේ තිබෙන්නාවූ නිකෙලෙස් නිරෝගී භාවය. කිසිම විදියක සැලකිල්ලක් මේ ශරීරයට දක්වන්න බෑ. කිසිම විදියකින් ශරීරය ගැන විස්වාසයක් තබන්න බැහැ. අපි මොන විදියට හිටියත් මේක දිරමින් අපාට වේවී අපාට වේවී පිළිකුල් වේවී යනවා. ඒ උනාට ලෝකයා ඔක්කෝම centers දාහෙන ඉන්නේ ශරීරයට. මනසට කිසිම සැලකිල්ලක් දන්වන්නේ නෑ.

එක දවසක් අපි ගියා Melbourne. මාව එක්කෙරගෙන ගියා city තියෙන tower එකට. Tower එකට යන ලිෆ්ට් එක ගාව තිබෙනවා hair dressing salon එකක්. ඉතින් අපිට ලිෆ්ට් එක එනකන් ඉන්න උනා. මගේ පුරුද්දක් තිබෙනවා කොහේ හරි ගියහම පොඩ්ඩක් කට්ටියට කථා කරනවා. එතන සුදු ළමයි වගයක් හිටියා. අපි සිවුරු පොරවාගෙන ඉන්නේ ඉතින් අමුතුයිනේ, එගොල්ලා ඇවිල්ලා

කථා කළා. මම ඇහුව ඒ ළමයාගෙන් කොහෙද වැඩ කරන්නේ කියලා. ඒ ළමයා කිව්වා ඒ salon එකේ වැඩ කරන්නේ කියලා. මම ඒ ළමයාගෙන් ඇහුවා එක hair dressing එකකට කීයක් අය කරනවද කියලා. මට උවමනාවකට නෙමෙයි, මාත් එක්ක නෝනලා ටිකක් attack එකට ඇවිල්ල තිබුණා. මට ඕන වෙලා තිබුණා ඒකට information ටිකක් එකතු කර ගන්න. එතැන හිටිය උත්සවයකට යන්න ඉස්සෙල්ලා hair dressing එකක් කරගන්න ආපු ළමයි දෙන්නෙක්. මම ඇහුව ඒවගේ එකකට කීයක් charge කරනවද කියලා. මට දැන ගන්න ලැබුණා එක්කෙනුකුගෙන් $35 ක් අය කරනවා කියලා. අනිත් එක්කෙනාගේ special එකක් නිසා $70 අයකරනවා කියලා කිව්වා. දැන් බලන්න party එක කොච්චර වේලාවක් තිබෙනවද? පැය දෙකක්. පැය දෙහෙකට කොණ්ඩේ හදන්න කීයක් යනවද? $35. දැන් එහෙම බැලුවයින් පස්සේ අපි යම්කිසි විදියකින් charge කරොත් එහෙම පැයක භාවනාවකට ඩොලර් දහයක්වත් අය කරොත් බැණ බැණ නේද යන්නේ. දැන් බලන්න hair dressing එකයි mental care එකෙයි වෙනස. ඇත්ත වශයෙන්ම මේවා free of charge. මේකෙන් අපි dress කරන්නේ මොකක්ද? ධර්මයෙන් dress කරන්නේ හිත. ඒක නිසා ලෝකයේ යන විදියයි මේ තථාගතයන් වහන්සේගේ ධර්මය යන විදියයි පැති දෙකක් නේද? ඒ පැති දෙක මජ්ඣිම නිකායේ සූත්‍ර දේශනාවක කියලා දෙනවා. මේක අහපු අය බැනලා ඊමේල් දාන්න එපා. මේක ඇත්තක් මම කිව්වේ.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස තථාගතයන් වහන්සේ දේශනා කරලා තිබෙනවා නේද පෘතක්ජනයෝ ඔක්කොම උම්මත්තකයෝ කියලා.

<u>පිළිතුර</u> - ඒක පරෙස්සමෙන් පාවිච්චි කරන්න ඕන. පෘතක්ජනයෝ උම්මත්තකයෝ කියලා දේශනා කරලා නෑ. එකම එක තැනක තිබෙනවා 'උම්මත්තකා විය' කියලා. හැබැයි සබ්බෙ පොථුජ්ජනා උම්මත්තකා කියලා තථාගතයන් වහන්සේ දේශනා කරලා නෑ. ඕක මහත්තය මෙහෙමයි. අපේ හාමුදුරුවරු කියන බණ තියෙනවනේ. හොඳට ධර්මය උගත් ස්වාමීන්වහ්සේලා වරද්දන්නෙ නැතුව අටුවාවේ දේ අටුවාවේ හැටියට කියන, පෙළේ දේ පෙළේ හැටියට කියන, මජ්ඣිම නිකායේ දේ මජ්ඣිම නිකායේ විදියට කියන, විනය විනය හැටියට කියන, අභිධර්මය අභිධර්මය හැටියට විස්තර කරන හොඳට පෙළ, අටුවා, ටීකා දන්න ස්වාමීන්වහන්සේලා ඉන්නවා. ලංකාවේත් ඉන්නවා. තායිලන්තයේත් ඉන්නවා. බුරුමේත් ඉන්නවා. වෙනත් රටවල්වලත් බොහොම සීමිත ප්‍රමාණයක් ඉන්නවා. ඒ ස්වාමීන්වහන්සේලාගෙන් අහල දැන ගන්න. මම දන්න දේ මම කියන්නේ.

මමත් ඔය වගේ ඇහිච්ච බණ කියලා තිබෙනවා මුල් කාලේ. කෙටි කාලයක්. පුරුදු වෙන කාලේ. හැබැයි මට හිතුනා එක දවසක් 'මම කියන මේ පදවල අර්ථය හොයන්න ඕනේ' කියල. බොහොම ලාබාල කාලේ. ඉතින් මම ලොකු ස්වාමීන්වහන්සේලාගෙන් ගිහිලලා ඇහුවා. එතකොට ඒ ස්වාමීන්වහන්සේලා කිව්වා තැනක තිබෙනවා, අහවල් තැන බලන්න ඕනේ කියලා. අරියධම්ම ස්වාමීන්වහන්සේගෙනුත් මම පස්සේ කාලෙක ඇහුවා. හැබැයි මම මුළු ත්‍රිපිටකයේම හෙව්වා ඕක. කොහේවත් නෑ. තථාගතයන් වහන්සේ සබ්බෙ පොථුජ්ජනා උම්මත්තිකා කියලා දේශනා කරලා නෑ.

එහෙමනම් අපි ජීවත් වෙන්නේ මහත්තයා පිස්සන්ගෙන් දානේ වළඳාලද? හිතලා බලන්න. ඊළඟට බෝධිසත්වවරු, පාරමී පුරාගෙන ආපු මෛත්‍රීබෝධිසත්වයන්වහන්සේ ආර්යද පෘතක්ජන්ද? පෘතක්ජනයි. තුසිත දිව්‍යලෝකේ වැඩ ඉන්නේ. තුසිත දිව්‍යලෝකයේ වැඩ ඉන්නාවූ මතු ලොව්තුරා බුදුවෙන්න ඉන්නාවූ මෛත්‍රීය බෝධිසත්වයන් වහන්සේ පෘතක්ජනයිනේ. එතකොට සබ්බෙ පොථුජ්ජනා උම්මත්තිකා කියලා ප්‍රකාශනයක් කලොත් එහෙම උන්වහන්සේ ඒකෙ අන්තර්ගත වෙනවා නේද? ඒක නිසා ඕවා බුදුරජාණන් වහන්සේ දේශනා කරපු ඒවා නොවෙයි.

ඕකේ තිබෙන්නේ වෙන කථාවක්. කෙලෙස් සහගත පුද්ගලයා උමතු විදියට හැසිරෙයි කියලා ගාථා කොටසක තියෙනවා කෑල්ලක්. ඕක ප්‍රකාශ කරන්න හොඳ නෑ. දැන් බලන්න ආර්ය භාවයට පත්වෙන්න පන්සිල් සමාදන් වෙන්නේ, පෝය අටසිල් සමාදන් වෙන්නේ, උපෝසථ සීලය සමාදන් වෙන්නේ, භාවනා කරන්න එන්නේ මේ කල්‍යාණ පෘතක්ජන පිරිස. ආර්ය භාවයට පත්වෙන්නේ මේ කල්‍යාණ පෘතක්ජන පිරිස. ඉතින් ඒ වගේ යහපත්ව බුදුරජාණන්වහන්සේ තමන් වහන්සේට දානේ දීපු මිනුස්සු ටික, තමන් වහන්සේගෙන් බණ අහන්න ආපු මිනුස්සු ටික උම්මත්තකයෝ නම් එයිද බණ අහන්න. ජේතවනාරාමයට යයිද? රජගහනුවරට යයිද? ඒවාගේ ප්‍රකාශන හොඳට කරුණු කාරණා ගලපලා බලන්න ඕනේ. ඒක නිසා එහෙම ප්‍රකාශනයක් නෑ. හැබැයි ඕක සමාජ ගත වෙච්ච මහා අමුතු කොහෙන් හරි ඇහිලා තිබෙන වැරදි අදහසක්. ඒක නිසා බොහොම පරෙස්සම් වෙන්න.

දැන් මේක මෙච්චර දුර ගියේ මොකක් ගැන කථා කරන්න ගිහිල්ලද? නිරුක්තිය ගැන කථා කරන්න ගිහිල්ලා. දැන් නැවතත් බලන්න

| |
|---|
| **සත්තසු ධම්මෙසු ඤාණානි, සත්තසු අත්ථෙසු ඤාණානි, චුද්දසසු නිරුත්තීසු ඤාණානි. අඤ්ඤානි ධම්මෙසු ඤාණානි, අඤ්ඤානි අත්ථෙසු ඤාණානි, අඤ්ඤානි නිරුත්තීසු ඤාණානි. යෙන ඤාණෙන ඉමෙ නානා ඤාණා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා ඤාණා පටිවිදිතාති. තෙන වුච්චති – “පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං”.** |

**සත්තසු ධම්මෙසු ඤාණානි** = ධර්ම හතක පිහිටියාවූ ඥාන හතයි

**සත්තසු අත්ථෙසු ඤාණානි** = අර්ථ හතක පිහිටියාවූ ඥාන හතයි

**චුද්දසසු නිරුත්තීසු ඤාණානි** = දහහතරක්( චුද්දසසු) වූ නිරුක්ති ඥාන

අඤ්ඤානි ධම්මෙසු ඤාණානි = ධර්මඤාණයෝ අනෙකක්

අඤ්ඤානි අත්ථෙසු ඤාණානි = ධර්මවල ක්‍රියාඅර්ථයන් දැනගැනීම අනෙකක්


අඤ්ඤානි නිරුත්තීසු ඤාණානි = භාෂා ඥානය අනෙකක්

**යෙන ඤාණෙන ඉමෙ නානා ඤාණා ඤාතා** = යම් කිසි නුවණකින් මේ ඥානයන්ගේ විවිධත්වය දැන ගත්තේද

**තෙනෙව ඤාණෙන ඉමෙ නානා ඤාණා පටිවිදිතාති** = යම්කිසි ඥානයකින් ඒ ඥානයන්ගේ විවිධත්වය අවබෝධ කර ගත්තාද

ඒකට කියනවා - **තෙන වුච්චති – “පටිභානනානත්තෙ පඤ්ඤා” = පටිභානපටිසම්භිදා ඤාණය** කියලා.


දැන් බලන්න මෙහෙම




ඉහතින් පෙනෙන රූපයෙහි ඇති පරිදි
**'සති' 'ධම්ම විචය' 'වීරිය' 'පීති' 'පස්සද්ධි' 'සමාධි' 'උපේක්ඛා'** යන සියලුම ධර්ම බලන්නේ **'ධම්මපටිසම්භිදා ඤාණයෙන්'.**


ඒ ධර්මයන් තුල තිබෙන්නාවූ අර්ථයන් එනම් ඒ ධර්මයන්ගේ ක්‍රියාකාරකම් බලන්නේ **'අත්ථපටිසම්භිදා ඤාණයෙන්'.**

අපි හිතමු අපි වාඩිවෙලා භාවනා කරන කොට මේ ඥාන පහළ උනා කියලා. දැන් මේක කාට හරි කියන්න වෙනවා. එතකොට අපිට අවශ්‍යයි වචන. දැන් අපි අවබෝධ කරගත් ධර්ම හතටත් ඒවායේ ක්‍රියා ස්වරූප හතටත් වචන යොදන්න තවත් නුවණක් අවශ්‍ය යයි, ඒ නුවණට කියන්නේ **'නිරුත්තිපටිසම්භිදා ඤාණය'** කියලා.



ධර්ම වලට දීලා තිබෙන වචන ප්‍රඥප්ති දැන ගන්නා වූ නුවණ අනෙකක්. දැන් එතකොට තිබෙනවා ගොඩවල් තුනක්. ධර්ම දැන ගන්නා නුවණ **'ධම්මපටිසම්භිදා ඤාණය'.** අර්ථය දැන ගන්නා නුවණ **'අත්ථපටිසම්භිදා ඤාණය'** සහ ධර්ම වලට සුදුසු වචන දැනගන්නා නුවණ **'නිරුත්තිපටිසම්භිදා ඤාණය'** යනුවෙන්.

තවත් ඥානයක් තිබෙනවා. ඒ ඥානයෙන් දැන ගන්නවා ධම්මපටිසම්භිදා ඤාණයෙන් ධර්මය දකින බවත් අත්ථපටිසම්භිදා ඤාණයෙන් ඒ ධර්ම වල අර්ථය දකින බවත් නිරුත්තිපටිසම්භිදා ඤාණයෙන් භාෂාව දකින බවත් ඒ ඤාණ තුනේ තිබෙන්නාවූ විවිධත්වය වෙනස් කම් සහ ඒ ඤාණ තුනේ තිබෙන්නාවූ ක්‍රියාකාරී ස්වභාවයන් ටික දැන ගන්නවා. ඒකට කියනවා ඤාණයන් පිළිබඳව දැන ගන්නාවූ ඤාණය කියලා = නුවණ ගැන දැන ගන්නාවූ නුවණ. මේ නුවණට කියනවා **'පටිභානපටිසම්භිදා ඤාණය'** කියලා.




මම දැන් මේක තේරුම් ගන්න තව උපකාරයක් කරනවා. ගොටුකොළ කියලා ශාක වර්ගයක් තිබෙනවා. දැන් ඔය ශාක වර්ගය කවදාහෝ අතීතයේ ශ්‍රී ලංකාවේ හෝ ඉන්දියාවේ මනුස්සයෙක් හොයා ගත්තා. උයලා හරි අමුවෙන් හරි කන්න හොඳ කොළයක් කියලා හොයා ගත්තනේ. එතකොට ඒක නමක් ඇතුව තිබුන කොළයක්ද? නමක් නැතුව තිබුන කොළයක්ද? නමක් නැතුව තිබුන කොළයක්. මොකක් හරි භූමියේ හැදිච්ච කොළ ජාතියක්. දැන්

ඒ කොළේ කවුරුහරි කඩාගෙන ආව. කපලා උයලා කෑවා. දැන් මේකේ ගුණේකුත් තිබෙනවනේ. ගොටුකොළ වෙනයි ගොටුකොළවල තිබෙන්නාවූ ගුණය වෙනයි. දැන් ගොටුකොළ කන්න කියලා කියනවා. ඊට පස්සේ ගුණය වෙනම කියනවා. ගොටුකොළ මොකටද ගුණ? මතක ශක්තිය වැඩි කරගන්න, හෙම්බිරිස්සාවට, ඇස් පෙනීමට හොඳයි කියලා කියනවා. දැන් බලන්න ඒක බෙහෙතක් හැටියට වගේ නේද තිබෙන්නේ. සෙම් අමාරුව සමනය කරනවා. පීනස සමනය කරනවා. දැන් පීනසය සමනය කිරීම තමයි ගුණය. ගොටුකොළ තමයි 'ධර්මය'. දැන් බලන්න මේකේ 'ගොටුකොළ' කියන එකයි 'ගුණය' කියන එකයි වචන දෙකක් නේද? දැන් එතකොට ගොටුකොළ පාවිච්චි කරන එක්කෙනා ඒකට කියන නම දැනගෙන තිබෙන්නත් ඕන. ඒකෙ තිබෙන ගුණේ දැනගෙන තිබෙන්නත් ඕන. එතකොට ගොටුකොළ වල 'අර්ථය' මොකක්ද? අර්ථය තමයි සෙම් අමාරුවට හොඳයි කියන එක. ගොටුකොළ කියන එක වෙන වචනයක්. දැන් එතකොට ගොටුකොළ පිළිබඳව තිබෙන දැනුමයි ඒකෙ තිබෙන ගුණ පිළිබඳ දැනුමයි දෙක තමයි 'භාෂා ඥානය'. ඒකට කියනවා 'නිරුක්ති ඥාණය' කියලා. මම දැන් ගොටුකොළ කියන වචනයත් දන්නවා. ඒකෙ තිබෙන ගුණයත් දන්නවා. ඒවාට කියන වචනත් දන්නවා කියලා ඒ තුනම පිළිබඳ දැනුමක් එනවා. ඒකට කියනවා 'පටිභාන ඥාණය' කියලා. මේවා ඔක්කොම එකට බැඳිලා තිබෙන්නේ.



1) ගොටුකොළ (ධර්මය)
2) ගුණය (අර්ථය)
3) භාෂා දැනුම (නිරුක්තිය)
4) දැනුමේ දැනුම (පටිභාන)

දැන් මේ පළවෙනි තුනේ දැනුම නැත්නම්, ඒ ධර්ම අරමුණු වෙන්නේ නැත්නම් 'දැනුමේ දැනුම' එන්නේ නෑ. මේවා ඔක්කොම එකට බද්ධ වෙලා තිබෙන ධර්ම.

<u>ප්‍රශ්නයක්</u> - දැන් සිව් පිළිසිඹියාපත් ඥාන කියන්නේ මේවට. නමුත් සමහර රහතන්වහන්සේලාට මෙය නොලැබෙන්නේ ඇයි?

<u>පිළිතුර</u> - සමහර කෙනෙකුට, පූර්ව වාසනාව තිබෙන්නා වූ අයට සෝවාන් මාර්ගත් එක්කම ලැබෙනවා. සමහර අයට රහත් උනාට පස්සේ ලැබෙන්නේ. ආනන්ද ස්වාමීන්වහන්සේට සෝවාන්වීමත් සමගම පිළිසිඹියාපත් ඥාන ලැබුණා. ගිහියන් අතුරෙන් චිත්ත ගෘහපති තුමාටත් පිළිසිඹියාපත් ඥාන ලැබුණා. අනිත් එක තමයි රහතන්වහන්සේලාට අනිවාර්යෙන්ම ලැබෙනවා නමුත් එක්තරා ප්‍රදේශයක. දේශනා කිරීමට ඒ ස්වාමීන්වහන්සේලා දන්නවා නමුත් දේශනා ඥානය නෑ. රහතන්වහන්සේලා උනත් හැම රහතන්වහන්සේම ධර්මය දේශනා කරලා නෑ. දේශනාවක් කරන්න පුළුවන් හැකියාව තිබෙන්නාවූ ස්වාමීන්වහන්සේලා රහතන්වහන්සේලා අතරත් ටිකක් හිටියා. රහත් වූ පමණින්ම ධර්ම දේශනා කරනවා කියන එක වෙන්නේ නෑ. සිව් පිළිසිඹියාපත් ඥාන සහිත රහතන්වහන්සේලාට ධර්ම දේශනාවක් කරපු ගමන්ම ඒ ඥානය තිබෙන නිසා තමයි වැරදෙන තැන් ඒ ස්වාමීන්වහන්සේලා දැනගන්නේ. අපි හිතමු යම් කිසි කෙනක් තථාගත ධර්මය වෙන වෙන විදියට දේශනා කරනවා. එතකොට සිව් පිළිසිඹියාපත් ඥානය තිබෙන්නා වූ රහතන්වහන්සේට තේරෙනවා ඒක නොවෙයි කියලා තථාගත ධර්මය කියලා.

<u>ප්‍රශ්නයක්</u> - හැම රහතන්වහන්සේටම සිව් පිළිසිඹියාපත් ඥාන තිබෙනවද?

<u>පිළිතුර</u> - ඔව්, චතු පටිසම්භිදාව තිබෙනවා. සිව් පිළිසිඹියාපත් ඥාන නිසා තමයි බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරකොට උන්වහන්සේලාට තේරෙන්නේ. ධර්මය දේශනා කිරීමයි ධර්මය වැටහීමයි කියන්නේ දෙකක්.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස දැන් ප්‍රථම ධර්ම දේශනාවේදී සිව් පිළිසිඹියාපත් සහිත රහතන්වහන්සේලා .......... (පැහැදිලි නැත)

<u>පිළිතුර</u> - උන්වහසේලා සිව් පිළිසිඹියාපත් වගේම ත්‍රිපිටක ධාරි. ත්‍රිපිටකය දන්නාවූ ස්වාමීන්වහන්සේලා. උන්වහන්සේලාගේ ධර්මඥාණය ඉහළටම


තිබෙනවා. ආනන්ද හාමුදුරුවෝ ධර්ම භාණ්ඩාගාරික. උපාලි ස්වාමීන්වහන්සේ ආනන්ද ස්වාමීන්වහන්සේ අනුරුද්ධ ස්වාමීන්වහන්සේ සහ ඒ ස්වාමීන්වහන්සේලාගේ ගෝලබාල පිරිස එකතුවෙලා ධර්මය ඉදිරිපත් කරනවා. එතකොට ඒ ඉදිරිපත් කරන ධර්මය අනිත් රහතන්වහන්සේලා තහවරු කරන්න ඕන. එතකොට ඒ ස්වාමීන්වහන්සේලා ඒ ධර්මය අහනකොට හැම රහතන්වහන්සේට හොඳට මෝරපු පිරිසිඳු වෙච්ච සිව් පිළිසිඹියාපත් ඤාන ශක්තිය තිබුණා. උන්වහන්සේලා ධර්මය store කරලා තිබුණේ නැතුවට උන්වහසේලාත් යම් යම් කොටස් අහලා තිබුණා. 'ඔය ආනන්ද හාමුදුරුවෝ කියන එක ඇත්ත. මාත් හිටිය එතන' කියලා ළඟින්ම හිටපු ස්වාමීන්වහන්සේලා හිටියා ස්ථිර කරන්න. එතන වැඩ හිටපු ස්වාමීන්වහන්සේලා ගැන කියන සූත්‍රම ආනන්ද හාමුදුරුවෝ දේශනා කරනවා. එතන හිටපු ස්වාමීන්වහන්සේලා ගැනම කියන විනය සම්බන්ධ කරුණු උපාලි මහා රහතන්වහන්සේ ප්‍රකාශ කරනවා. උන්වහන්සේලා දන්නවා මේ වචනය මේකටයි මේ වචනය මේකටයි මේ පදය මේකටයි කියලා. ඒ දැනුම නිසා උන්වහන්ස්ලාට වැරදුනේ නෑ.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස දැන් පටිච්චසමුප්පාදය ගැන දන්නවා කියන කොට ඒ එකක් ගැන ඔය හතර ආකාරයටම දැන් ගන්න ඕනෙද?

<u>පිළිතුර</u> - දැන් බලන්න අවිද්‍යාව ගැන බලන විදිය. අවිජ්ජා කියලා ධර්මයක් තිබෙනවද? ඔව් එහෙම ධර්මයක් තිබෙනවා. අවිද්‍යාවේ අර්ථය තමයි සත්‍ය වැසීම. 'අවිද්‍යාව කියලා ධර්මයක් තිබෙනවා' - 'ඒ ධර්මයේ අර්ථය එනම් ක්‍රියාව සත්‍ය වැසීමයි' කියලා ඒ දෙක හඳුනාගැනීමට ඇති වචන දෙක දැනගැනීම තමයි 'භාෂා දැනුම'. භාෂාව ගැන තේරෙන, අර්ථය ගැන තේරෙන, ධර්මය ගැන තේරෙන ඒ දැනුමට කියනවා දැනුමේ දැනුම නොහොත් 'ඤානයේ ඤානය' කියලා (පටිභාන). මේක හැම එහෙකටම තිබෙනවා. නමුත් මේක විස්තර කරන්නේ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ගේ කොටස් වශයෙන්.

ඔබ සැමට තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි